# හිත හොඳ පූසී







කෞෂානි දෙව්නෙත්මි ප්‍රනාන්දු
2-A

# හිත හොඳ පූසි



කතාව සහ චිත්‍ර

**කෞෂානි දෙව්නෙත්මි ප්‍රනාන්දු**
2 ශ්‍රේණිය A
මහාමායා බාලිකා විදුහල

ISBN අංකය: ISBN 978-624-206-971-5

කතෘ ප්‍රකාශනය
මුද්‍රණය 2023 නොවැම්බර්

# පිදුම

මා ඇති දැඩි කර පෝෂණය කරන
මාගේ ආදරණීය අම්මා තාත්තා සහ
අධ්‍යාපනය නැමැති මිලකළ නොහැකි
දායාදය ලබා දෙමින් මෙම පොත
ලිවීමට මා හට උපදෙස් සහ
මඟපෙන්වීම ලබාදුන් මහමායා
බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය සහ
2- A පන්තිභාර ගුරුතුමිය ඇතුළු
පාසලේ සියලුම ගුරු මැණිවරුන්ට
සහ පියවරුන්ට මෙම කෘතිය  පුදකර
සිටිමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැඟීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර
2023 . 11 . 01

එකමත් එක
රටක  මී ගුලක
 මී අම්මයි,
මී පැටවු හතර
දෙනෙකුයි ජීවත්
වුණා.
ඉතින් එක
දවසක් මී අම්මා
ගෙදර දොරත්
වහලා කඩයට
ගියා.



පැටවුන්ට කෑම හොයන්න ගිය මී අම්මට හරිම කරදරයක් තමයි වුණේ, එකපාරටම කෑම හොයා ගෙන යන පූසියෙක් මේ මී අම්මව අල්ලගත්තා. මී අම්මට ගැලවීමක් නම් වුණේ නැහැ.





හවස් වී ගෙනත් ආවා.ඒත් මී අම්මා
තාම ගෙදර ආවේ නෑ. රෑත් වුණා.
ඒත් මී අම්මා තාම නෑ.


මී පැටවු අඬ අඬා බඩගින්නේ හිටියා. ඊළඟ දවසේ පැටවු අම්මා හොයන්න ගියා.



දවසක් පුරාම අම්මව හෙව්වත් මේ පැටවුන්ට අම්මව හම්බ වුණේ නැහැ. පැටවුන්ට හොඳටම බඩගිනි වුණා. අම්මවත් ගොඩක් මතක් වුණා.

වතුර තිබහ නිසා වතුර ටිකක් බොන්න හිතාගෙන ළඟ තිබුණු දොළකට පැටව් ටික බැස්සා.

*දොළේ වතුර පාර ඒ වෙලාවේ වැඩි වෙලා පැටව් දෙන්නෙක් ගහගෙන ගියා. අනික් පැටව් හොඳටම ඇඬුවා.*



මේ වෙලාවේ එතනින් ගිය පූසිට මේ සද්දේ ඇහිලා එතනට ආවා. පැටවු දැකලා එයාට දුක හිතුණා. එයා ඉක්මනින්ම වතුරට පැනලා අමාරුවෙන් පීනලා ගිහින් මී පැටව් දෙන්නා බේරාගත්තා.





මී පැටවු
බයවෙලා
අඬන්න
පටන්ගත්තා.
“බය වෙන්න
එපා. මම
ඔයාලව
කන්නේ නෑ”
පූසී කිව්වා.

“ඇයි ඔයාලා තනියම පාරේ
යන්නේ? ”පූසි ඇහුවා.
ඊට පස්සේ පැටවු මුළු විස්තරයම
පූසිට කිව්වා. පූසිට මතක් වුණා
ඊයේ එයා මී අම්මාව කෑවා කියලා.





පූසිට ගොඩක් දුක හිතුණා. පූසි එයාගේ ගෙදරට මී පැටවු එක්කන් ගියා.

පූස් පැටවු එක්ක ඒ ගෙදර හැමදාම ඉන්න කිව්වා.



පූසිගේ ගෙදර හිටපු පූස් පැටවූ ටිකත් මේ අයට ගොඩක් ආදරෙන් සැලකුවා. ඊට පස්සේ පූස් පැටවු ටිකයි මී පැටවු ටිකයි ගොඩක් සතුටින් හිටියා.



පූසි මේ මී පැටවුන්ට අම්මා කෙනෙක් වෙලා ආදරෙන් බලාගත්තා.

# ප්‍රසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දියුණුවට මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN 978-624-206-971-5